වාර්ෂික වාර්තාව සහ ගිණුම්

ஆண்டறிக்கையும் கணக்குகளும்

ANNUAL REPORT & ACCOUNTS

01-04-2022---31-03-2023



ජාතික ලුණු සමාගම
தேசிய உப்பு நிறுவனம்
NATIONAL SALT LIMITED

ජාතික ලුණු සමාගම
தேசிய உப்பு நிறுவனம்
NATIONAL SALT LIMITED

කර්මාන්ත අමාත්‍යාංශය

கைத்தொழில் அமைச்சு

Ministry of Industries

රජයට අයත් සමාගමකි

அரசுக்குச் சொந்தமான கம்பனி

Government Owned Company

වාර්ෂික වාර්තාව සහ ගිණුම්

ஆண்டறிக்கையும் கணக்குகளும்

ANNUAL REPORT & ACCOUNTS

2022.04.01 – 2023.03.31

පටුන

1.	සභාපතිතුමාගේ සමාලෝචනය	02
2.	සාමාන්‍යාධිකාරීතුමන්ගේ පණිවිඩය	03
3.	සංස්ථාපිත තොරතුරු	04
	හැඳින්වීම	05
	4.1 සමාගම් ව්‍යුහය	05
	4.2 නිෂ්පාදන වැඩබිම් සම්බන්ධ විස්තර	06
	4.3 නිෂ්පාදන තොරතුරු	07
	4.4 අලෙවිය	07
5.	සංවර්ධනය කිරීම සඳහා දැනට පවතින ප්‍රධාන ක්ෂේත්‍ර	07
	5.1 මෙම සංවර්ධන කටයුතුවල සැළකිය යුතු ප්‍රතිදානය	08
6.	මූල්‍ය සාරාංශය	09
7.	ප්‍රධාන මාණ්ඩලික නිළධාරීන්ගේ විස්තර	10
8.	සංවිධාන ව්‍යුහය	11
9.	අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව	12-13
10.	කොටස් හිමිවරුන් වෙත ස්වාධීන විගණක වාර්තාව	15-23
11.	විගණනය කරන ලද ගිණුම් 2022/2023	25-75

1. සභාපතිතුමාගේ සමාලෝචනය

ජාතික ලුණු සමාගමේ වර්තමාන සභාපති වශයෙන් මම, 2022/2023 වර්ෂය සඳහා සමාගමේ වාර්ෂික ගිණුම් පිළිබඳ මාගේ සමාලෝචනය මෙයින් ඉදිරිපත් කරමි. සමාගමේ 2022/2023 වාර්ෂික මහා සභා රැස්වීමට ඔබව සාදරයෙන් පිළිගැනීමට ලැබීම ගැන ද, 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය ඔබ වෙත ඉදිරිපත් කිරීමට ලැබීම ගැන ද මම සතුටට පත් වෙමි.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ජාතික ලුණු සමාගම රු. 343,140,970.00 ක පිරිවැටුමක් සාක්ෂාත්කර කරගෙන ඇති අතර, වර්ෂයේ බදු ගෙවීමට පෙර ලාභය වශයෙන් රු. 192,871,896.00 ක් උපයා ඇත. ආරම්භයේ සිටම අපගේ කාර්ය සාධනය දෙස ආපසු හැරී බලන විට අපගේ කාර්යය සාධනය පිළිබඳව අපට සාධාරණීකරණය කළ හැකිවාක් මෙන්ම අඩම්බර විය හැකිය. සමාගමේ වාර්ෂික නිශ්පාදන සහ විකුණුම් කාරයයන් 2022/2023 වර්ෂය තුල දී විශිෂ්ඨ අභිවාද්ධියක් පෙන්නුම් කරන අතර, වර්ෂය තුළ රාජ්‍ය බදු වශයෙන් සමාගම විසින් රු. 58,065,642.00 ක මුදලක් ගෙවා ඇත.

ශ්‍රී ලංකාවේ ලුණු කර්මාන්තය සක්‍රීය ලෙස සංවර්ධනය කිරීම හා තිරසාර ලෙස පවත්වාගෙන යාම සඳහා පහසුකම් සපයන්නා ලෙස කටයුතු කිරීමට සමාගමට හැකි වූ බව කොටස් හිමියන් වෙත මම සතුටින් දන්වා සිටිමි2022/2023 වර්ෂය තුළ දී ලබාගන්නා ලද කොටසක ඉපැයුම රු. 449.35 ක් විය.

2023.03.31 දින වන විට, වර්ෂය සඳහා අනුමත කරන ලද මුළු සේවක සංඛ්‍යාව 167 ක් විය. එකී දිනය වන විට සිටි ස්ථීර සේවක සංඛ්‍යාව 52 ක් වූ අතර, ඉතිරි සේවක සංඛ්‍යාව අවශ්‍යතාවය අනුව කොන්ත්‍රාත් සහ අනියම් වාරික පදනම මත බඳවා ගන්නා ලද සේවකයින්ගෙන් පුරවා ඇත. සෑම ස්ථරයකම සිටින සියලුම සේවකයින්ගේ පූර්ණ සහයෝගය අඛණ්ඩව අප වෙත ලැබෙන බව දන්වා සිටින්නේ සතුටිනි.
ජාතික ලුණු සමාගමේ අපේක්ෂිත අරමුණු සාර්ථකව ඉටු කර ගැනීම සඳහා නව ස්කන්ධ ප්‍රාග්ධනයක් යෙදවීම තුළින් එහි වර්තමාන ප්‍රාග්ධන පදනම ශක්තිමත් කිරීම අවශ්‍ය වේ.

මේස ලුණු යන්ත්‍රාගාරයක් මිල දී ගෙන එමඟින් අගය එකතු කිරීමේ නිශ්පාදන ක්‍රියාවලිය වැඩි කිරීමටත්, වෙළෙඳපොළේ මේස ලුණු අලෙවිය වැඩි කිරීමටත් සහ එමඟින් විකුණුම් ආදායම වැඩි කිරීමටත් සභාපතිවරයා ලෙස මා සැලසුම් කර තිබෙනවා. තව ද අලි මංකඩ ලුණු ලේවාය පූර්ණ ධාරිතාවයෙන් යුතුව ක්‍රියා කරවීමට සුදුසු පරිදි ප්‍රතිසංස්කරණය කරනු ලබන අතර, සීමාසහිත පරන්තන් රසායන සමාගමට සැපයුම සහතික කරනු පිණිස කුරින්චිච් ලුණු ලේවාය සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියේ අපගේ කළමනාකරණ මණ්ඩලය නිරත වී සිටී.

කර්මාන්ත අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව ද, මුදල් අමාත්‍යාංශය ද, රාජ්‍ය අධිකාරීන් මෙන්ම ගනුදෙනුකරුවන් විසින් ද අප වෙත ලබා දෙන අඛණ්ඩ දිරිගැන්වීම් සහ සහයෝගය පිළිබඳව අපි සතුටට පත් වන්නෙමු.

මේ අනුව ජාතික ලුණු සමාගමේ අපට ඇති සියළුම අභියෝගයන්ට මුහුණ දීමට සහ අපගේ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතාවන් සම්බන්ධයෙන් කඩිනමින් හා ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමට සූදානම් වන අතර, එමඟින් ආයතනයේ අඛණ්ඩ සාර්ථකත්වය සහතික කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින මගේ සහයකයින්ට සහ කළමනාකාරීත්වයට සහ කාර්ය මණ්ඩලයට, ඔවුන් මා වෙත දක්වන ලද සහයෝගය වෙනුවෙන් මාගේ අවංක ස්තුතිය පුද කර සිටිමි.

ඩී.ආර්. අනුර බණ්ඩාර
සභාපති

2. සාමාන්‍යාධිකාරීතුමන්ගේ පණිවිඩය

ජාතික ලුණු සමාගමේ විසින්, 2022 අප්‍රේල් 01 දින සිට 2023 මාර්තු 31 දින දක්වා කාලය තුළ දී සිය ක්‍රියාකාරකම්, කාර්යයන් අඛණ්ඩව සිදුකරගෙන යාම සහ ලාභ උපයා ගැනීම සම්බන්ධ වාර්ෂික මහා සභා රැස්වීමේදී මගේ පණිවිඩය ඉදිරිපත් කිරීමට ලැබීම මා ලද මහඟු අවස්ථාවකි.

පවත්නා මූල්‍ය වර්ෂයේදී මන්නාරම ලුණු ලේවාය සහ අලි මංකඩ ලුණු ලේවාය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හැකි විය. 2015 ජනවාරි මස 15 දිනැති අංක 1897/ 15 දරණ අති විශේෂ ගැසට් නිවේදනයට අනුව, 2015 පෙබරවාරි මස සිට අලිමංකඩ ලුණු ලේවායේ පරිපාලන කටයුතු නැවතත් ජාතික ලුණු සමාගම යටතට පත්විය. මහා භාණ්ඩාගාරයේ මූල්‍ය සහයෝගය ඇතිව සිදුකෙරෙන එහි ප්‍රතිසංස්කරණ කටයුතුවලින් 90% ක් අවසන් කර ඇත.

2022/2023 වර්ෂය සඳහා අයවැයගත ප්‍රමාණය වූ මෙ.ටො.5500 ට සාපේක්ෂව, මෙම මූල්‍ය වර්ෂය තුළ දී මන්නාරම ලුණු ලේවායෙහි ලුණු මෙට්‍රික් ටොන් 2245 ක් නිෂ්පාදනය කිරීමට අපගේ කණ්ඩායමට හැකි වූ අතර, අයවැයගත ප්‍රමාණය වූ මෙ.ටො. 16,000 ට සාපේක්ෂව 2022/2023 වර්ෂය සඳහා ලුණු මෙට්‍රික් ටොන් 6288 ක් අලි මංකඩ ලුණු ලේවායෙහි නිෂ්පාදනය කිරීමට හැකි විය. අයහපත් කාළගුණික තත්වයන් හේතුවෙන් නිශ්පාදන අනුපාතය අඩු වී ඇත. අයවැයගත ප්‍රමාණය වූ මෙ.ටො.5500 ට සාපේක්ෂව මන්නාරම ලුණු ලේවායෙන් ලුණු මෙට්‍රික් ටොන් 2,132 ක් ද අයවැයගත ප්‍රමාණය වූ මෙ.ටො. 16,000 ට සාපේක්ෂව එලිපන්ට්පාස් ලුණු ලේවායෙන් ලුණු මෙට්‍රික් ටොන් 6,734 ක් ද, කි.ග්‍රෑ. 1 පැකට් කරන ලද සාමාණ්‍ය ලුණු සහ අයඩින් මිශ්‍ර ලුණු, සහ කාර්මික ලුණු සහ කැට ලුණු යන ආකාරයට අලෙවිකරන ලද අතර, වර්ෂය සඳහා මුළු ශුද්ධ පිරිවැටුම රුපියල් මිලියන 343,140,970.00 කි. සකස් කරන ලද ගිණුම් අනුව මෙම වසර සඳහා බදු ගෙවීමට පෙර තථ්‍ය ලාභය රුපියල් 192,871,896.00 කි.

අපගේ සමාගම සාධාරණ මිලකට ලුණු විකිණීමෙන් පාරිභෝගිකයින්ට සේවා සැපයීම සිදු කරනවා පමණක් නොව, ආදායම් බදු ලෙස රුපියල් මිලියන 58.06 ක් රජයට ගෙවා ඇති අතර, තවද සාධාරණ ලාභාංශ ප්‍රමාණයක් භාණ්ඩාගාරයට ගෙවීම ද සිදු කරනු ලබන බව ඉතා ආඩම්බරයෙන් ප්‍රකාශ කර සිටිමි.

2026 වර්ෂය වන විට ශ්‍රී ලංකා වෙළඳපලින් 18% ක් සපයනු ලබන ප්‍රධාන ලුණු නිෂ්පාදකයා බවට ජාතික ලුණු සමාගම පත් කිරීමට කළමනාකරණය අරමුණු කර ඇත.

මෙම මූල්‍ය වර්ෂය තුළ දී සේවය කරන ලද කාර්ය මණ්ඩලය, ඉලක්ක සඳහා පුහුණු කිරීම, ඇගයීම, මූලික පහසුකම් සැපයීම, ප්‍රසාද දීමනා ගෙවීම යනාදී විවිධාකාර වූ ක්‍රියාකාරකම් මඟින් බලගන්වා ඇත.

අවසාන වශයෙන්, මෙම සමාගමේ සාර්ථකත්වය සඳහා ඔවුන්ගේ හෘදයාංගම දායකත්වයක් ලබා දීම වෙනුවෙන් මම කර්මාන්ත අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමන්ට සහ ලේකම්තුමාටත්, ආයතනයේ සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය සහ මාගේ කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තූතිය ප්‍රකාශ කර සිටිමි.

එම්.ජේ. තුවාන් මන්සිල්
සාමාන්‍යාධිකාරී

3. සංස්ථාපිත තොරතුරු

සමාගමේ නම	ජාතික ලුණු සමාගම (රජය සතු සමාගමකි)
රේකීය අමාත්‍යාංශය	කර්මාන්ත අමාත්‍යාංශය
ප්‍රධාන කාර්යාලය	561/3, ඇල්විටිගල මාවත ,කොළඹ.05
මන්නාරම ලුණු ලේවාය	ගෑන්ඩි බසාර්, මන්නාරම.
අලි මංකඩ ලුණු ලේවාය	A9 මාර්ගය, අලි මංකඩ, කිළිනොච්චි
සමාගමේ ලියාපදිංචි අංකය	[N(PBS)942] නව අංකය: PB 1078
කොටස් හිමිකරුවන්	මහා භාණ්ඩාගාරය
අධ්‍යක්ෂ මණ්ඩලය	1. ඒ.පී. මොරගොඩ මහතා – සභාපති 09/12/2022 දින දක්වා ඩී. ආර්. අනුර බණ්ඩාර මහතා – සභාපති 13/12/2022 දින සිට 2. එල්. පී. වැවලගේ මහතා – භාණ්ඩාගාර නියෝජිත 3. ඩබ්. පී හපුආරච්චි මහතා 4. එම්. එම්. ශාන්ත කුමාර මහතා 5. එල්. කේ. ජේ. ප්‍රියංකර මහතා 6. ආචාර්ය එස්. එම්. ජේ. ධර්මකීර්ති මහතා 7. ආචාර්ය එම්. එච්. එන්. කරුණාසිරි මහතා 8. ඩබ්. එම්. එන්. ජයන්ත පුෂ්පකුමාර මහතා 9. ඩබ්. එම් ජානක ආර්. වික්‍රමසිංහ මහතා 10. ආර්. එම්. ශ්‍රීලාල් තිලකරත්න මහතා 11. සේපාල සෙනෙවිරත්න මහතා 12. එච්. එම්. ධම්මික කේ ප්‍රේමතිලක මහතා
නිරීක්ෂක	එස්ග එන්. බාලසුබ්‍රමනියම් මහතා – නිරීක්ෂක
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්	කෝපරේට් එෆයාර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
විගණක	රජයේ විගණකවරුන් ජාතික විගණන කාර්යාලය, ශ්‍රී ලංකාව
බැංකුකරු	ලංකා බැංකුව

4. හැඳින්වීම

4.1සමාගම් වෘත්තය

ශ්‍රී ලංකාවේ ලුණු නිෂ්පාදනය සම්බන්ධයෙන් දීර්ඝ ඉතිහාසයක් ජාතික ලුණු සමාගම සතුව ඇත. එම ආයතනය සාමාන්‍ය ලුණු, අයඩින් ලුණු, කැට ලුණු සහ කාර්මික ලුණු නිෂ්පාදනය කරනු ලබයි. එහි ප්‍රධාන නිෂ්පාදන බිම් මන්නාරම සහ අලිමංකඩ (කිළිනොච්චි) යන ප්‍රදේශවල පිහිටා ඇති අතර, එහි පරිපාලන කාර්යාලය කොළඹ පිහිටා ඇත.

ලුණු දෙපාර්තමේන්තුව 1938 වර්ෂයේ දී ආරම්භ කර ඇති අතර, විවිධ වූ පරිපාලන අධිකාරීන් යටතේ පැවති එය අවසානයේ දී 2001 වර්ෂයේ සිට මාන්තායි සෝල්ට් ලිමිටඩ් ලෙස නම් කරන ලදුව 2021 ජූනි මාසයේ දී එය ජාතික ලුණු සමාගම ලෙස නැවත නම් කරන ලදී. වර්තමානයේ එය කර්මාන්ත අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වේ. මෙම සමාගම විසින් නිෂ්පාදනය කරනු ලබන ලුණු දිවයිනේ අනෙකුත් ප්‍රදේශවලින් නෙලාගන්නා ලුණු හා සැසඳීමේ දී ගුණාත්මක බවින් ඉතාම ඉහල අගයක ඇති බව පිළිගැනේ. (එහි 96% ක් සෝඩියම් ක්ලෝරයිඩ් වේ). වර්තමානයේ මන්නාරම ලුණු ලේවායේ වර්ෂයකට සකස් නොකළ ලුණු මෙ.ටොන් 6,000 ක් නිශ්පාදනය කිරීමේ නිශ්පාදන ධාරිතාවයකින් යක්ත වන අතර, අලි මංකඩ ලුණු ලේවායේ වාර්ෂික ලුණු නිශ්පාදනය කිරීමේ ධාරිතාවය ලුණු මේ. ටොන් 17,000 ක් වේ.


ජාතික ලුණු සමාගම ස්වාභාවික සම්පත් උපයෝගීතා මධ්‍යස්ථානයක් ලෙස පමණක් නොව, මන්නාරම සහ කිලිනොච්චි දිස්ත්‍රික්කයන් හි අවදානමට ලක් වූ (පීඩිත) ජනතාවන්ට රැකියා අවස්ථාවන් ද ලබා දෙන මධ්‍යස්ථානයක් ලෙස ද ක්‍රියාත්මක වේ. මේ වන විට 63 දෙනෙකුගෙන් සමන්විත වන ස්ථීර කාර්ය මණ්ඩලයක් සහ කොන්ත්‍රාත් පදනම මත/ අනියම් සේවකයින් 7 දෙනෙකුලේන සමන්විත් කාර්ය මණ්ඩලයක් සිටින අතර, දළ වශයන් පුද්ගලයින් 242 දෙනෙකුගෙන් සමන්විත වන තාවකාලික කාර්ය මණ්ඩලයක් ආයතනය විසින් සේවයේ යොදවා ඇත.

ජාතික ලුණු සමාගම, මහා භාණ්ඩාගාරයේ සහ අනෙකුත් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල සාමාජිකයින්ගෙන් සැදුම්ලත් මණ්ඩලය විසින් පාලනය වන අතර, එය කර්මාන්ත අමාත්‍යාංශයේ විෂය පථය යටතට අයත් වේ. සමාගමේ නෛතික සහ වගකිවයුතු කාර්යයන් සම්බන්ධ අධීක්ෂණ කටයුතු සහ පහසුකම් සැපයීමේ කටයුතු අමාත්‍යාංශයේ සංස්ථාපිත අංශය විසින් සිදු කරනු ලබයි. එය රාජ්‍ය ව්‍යාපාරයක් බැවින් 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සීමාසහිත සමාගමක් ලෙස සමාගම් නීති රීති වලට අනුකූලව ලියාපදිංචි කර ඇත. මේ අතර අගය එකතු කළ නිෂ්පාදනයන් හී ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා මෙම ආයතනය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් සහතික කරනු ලැබේ. එසේම සමාගම රජයේ විගණකවරුන් විසින් විගණනය කරනු ලැබේ.

සමාගමේ ඉතිහාස තොරතුරු

වර්ෂය		**Name of Institute**
සිට	**දක්වා**	
1938	1965	ලුණු දෙපාර්තමේන්තුව
1966	1990	ශ්‍රී ලංකා ජාතික ලුණු සංස්ථාව
1991	1996	ලංකා සෝල්ට් ලිමිටඩ්
1997	/2001 සැප්ග දක්වා	මන්නාරම දිසාපති යටතේ මන්නාරම ලුණු ලේවාය
/2001 ඔක්.	2021 ජූනි දක්වා	මාන්තායි ලුණු සමාගම (උතුරු පළාතේ පිහිටි ලුණු ලේවායන්)
2021 ජූනි	මේ දක්වා	ජාතික ලුණු සමාගම (උතුරු පළාතේ පිහිටි ලුණු ලේවායන්)

දැක්ම



ව්‍යාපාරයේ ස්වභාවය අනුව සමාගම පහත පරිදි දැක්මකින් යුක්ත ය.

"රසායනික හා වෙනත් ක්‍රියාවලීන් හා සම්බන්ධ ස්වාභාවික සම්පත් ගවේෂණය කිරීමෙන් උතුරු පළාතේ ලුණු ආශ්‍රිත ව්‍යවසායන් සංවර්ධනය කිරීම සහ එමඟින් ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම".

මෙහෙවර

සමාගමේ මෙහෙවර පහත පරදි වේ .

"ලුණු ලේවායන් මෙහෙය වීම, ලුණු නිශ්පාදනය, අගය එකතු කිරීම සහ ලුණු සහ අතුරු නිශ්පාදන අලෙවි කරණය"

4.2 නිෂ්පාදන වැඩ බිම් සම්බන්ධ විස්තර

අ) මන්නාරම ලුණු ලේවාය

මන්නාරම ලුණු ලේවායේ සම්පූර්ණ නිෂ්පාදන භූමි ප්‍රමාණය අක්කර 163 කි. වාර්ෂික ලුණු නිෂ්පාදනය ආසන්න වශයෙන් මෙ.ටො. 6000 ක් වන අතර එය ශ්‍රී ලංකාවේ මුළු ලුණු නිෂ්පාදනයෙන් 3.3% ක් වේ. ලාභ ඉපැයීමේ ආයතනයක් ලෙස මෙම ආයතනය තම ලාභය මඟින් සිය කාර්ය මණ්ඩල වැටුප් ගෙවීම හා සුභ සාධන කටයුතු සමඟ ම ආයතනයේ යම් සංවර්ධන හා නඩත්තු කටයුතු සිදු කරයි.

ආ) අලිමංකඩ ලුණු ලේවාය

අලිමංකඩ ලුණු ලේවායේ සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වන නිෂ්පාදන භූමි ප්‍රමාණය අක්කර 750 වන අතර, නිශ්පාදන ධාරිතාව සාමාන්‍යයෙන් වසරකට මෙ.ටො. 25,000 කි.

මෙම ලුණු ලේවායේ නවීකරණ කටයුතුවලින් 90% ක් දක්වා සාර්ථකව නවීකරණය කර ඇති අතර, 2016 වසරේ සිට නිශ්පාදන ක්‍රියාවලිය ආරම්භ කරන ලද අතර 2021/2022වන විට මෙ.ටො. 5283ක නිශ්පාදනයක් සාක්ෂාත් කරගෙන ඇත.

වර්තමානයේ මෙම ලුණු ලේවායන් දෙකෙහිම සාමාන්‍ය ලුණු නිශ්පාදන කරන අතර, නුදුරු අනාගතයේ දී ම මේස ලුණු යන්ත්‍රාගාර ස්ථාපිත කිරීම මඟින් අගය එකතු කිරීමේ ක්‍රියාවලියක් මහා පරිමාණයෙන් සිදු කිරීමට සැලසුම් කරමින් පවතී.

4.3 නිශ්පාදන විස්තර

ලුණු ලේවාය	2017/2018	2018/2019	2019/2020	2020/2021	2021/2022	2022/2023
මන්නාරම	6284	6249	6683	2,786	2378	2245
අලි මංකඩ	7130	10314	16089	8,496	5283	6288
එකතුව	**13414**	**16,563**	**22772**	**11,282**	**7661**	**8533**

4.4 අලෙවිය

වර්ෂය	අලෙවිය(මෙ.ටො.)	ආදායම(මිලි.) රු.
2015/2016	5063	62.3
2016/2017	3337	93.8
2017/2018	6094	83.7
2018/2019	16,146	155.38
2019/2020	13,063	103.47
2020/2021	23,484	201.56
2021/2022	14312	249.05
2022/2023	8,866	343.14

5. යෝජිත අනාගත සංවර්ධන සැලැස්ම

අ) මන්නාරම ලුණු ලේවාය

1) සමාගම පැයට මෙ.ටොන් 02 ක් නිපදවන ස්ඵටික ලුණු යන්ත්‍රාගාරය සාර්ථකව ස්ථාපනය කර ඇත. මේ වන විට ඇසුරුම් කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර, දිස්ත්‍රික්කය තුළ බෙදාහරින්නන් සහ තොග වෙළඳුන් මගින් විකිණීම සිදු කරනු ලබයි.
සමාගම වසරකට මෙට්‍රික් ටොන් 3000 ක් සඳහා ස්ඵටික ලුණු පැකට් කිරීමේ ක්‍රියාවලිය පුළුල් කිරීමේ කටයුතුවල නිරතව සිටින අතර, ඒ අනුව අලෙවිකරණ සහ විකුණුම් ඒකකයක් සංවර්ධනය කරමින් පවතී.
තවද, මේස ලුණු යන්ත්‍රාගාරයක කොටසක් සවි කිරීම මඟින් යන්ත්‍රාගාරය වැඩිදියුණු කර මේස ලුණු නිෂ්පාදනය කිරීමට සැලසුම් කර ඇත.

2) මන්නාරම ලුණු ලේවායේ පරිපාලන කටයුතු සඳහා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමට නියමිතය.

3) මන්නාරම ලුණු ලේවාය සඳහා ක්ෂේත්‍ර කාර්යාලය ඉදිකිරීමට නියමිතය.

ආ) අලි මංකඩ ලුණු ලේවාය

අක්කර 750 ක භූමි ප්‍රදේශයක නිශ්පාදන කටයුතු ආරම්භ කිරීම සඳහා පූර්ණ ධාරිතාවයෙන් යුතු ලුණු ලේවාය පුනරුත්තාපනය කිරීම.
පැයකට මෙ.ටොන් 05ක ධාරිතාවයෙන් යුත් මේස ලුණු කම්හලක් ස්ථාපනය කිරීමට කටයුතු කරමින් පවතී..

5.1 මෙම සංවර්ධන කටයුතුවල සැළකිය යුතු ප්‍රතිදානය.

- නව යන්ත්‍රාගාර මඟින් නිපදවන ස්ඵටික ලුණු නිශ්පාදනය සහ අලෙවිය, වෙළඳපළ ව්‍යාප්ත කිරීමට සහ පුළුල් කිරීමට උපකාරී වන අතර, එමඟින් වෙළඳපල තුළ සමාගමේ ශක්‍යතාව සහතික කෙරේ.
- අලෙවිය වැඩි කිරීම සහ කඩිනම් කිරීම මඟින් තොග ගබඩා කිරීමේ සහ රඳවා තබා ගැනීමේ කාල සීමාවන් අඩු කිරීමට හැකි වේ.
- අවශ්‍යතා පුළුල් කිරීම මත රැකියා අවස්ථා නිර්මාණය කෙරේ.
- වැඩිවන ලාභය මඟින් සේවකයින්ට වැඩි සුභසාධන පහසුකම් සහ ප්‍රතිලාභ ලබා දීමට මූලික වේ.
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ නිර්ණායක සපුරාලන අතර ගුණාත්මකභාවය පවත්වාගෙන යනු ලැබේ.
- ග්‍රාමීය වෙළඳපොලේ නිෂ්පාදන සාධාරණ මිලකට ලබා දීම මඟින් අයඩින් ඌනතා ගැටලුව තුරන් කිරීම සඳහා නිෂ්පාදන හා සිල්ලර වෙළඳාම දායක වේ.
- සැලකිය යුතු ලාභාංශ භාණ්ඩාගාරයට ගෙවනු ලබන අතර, මහජනතාවට අවසාන ප්‍රතිලාභය ලබා දෙනු ලබන ජාතික සංවර්ධනය සඳහා වන වැටි බදු (අගය එකතු කිරීම මත බදු) හා ජාතිය ගොඩ නැගීමේ බදු වැනි බදු රජයට ලැබෙනු ඇත.


6. මූල්‍ය සාරාංශය

මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	ඒකක	2022/2023	2021/2022	2020/2021	2019/2020	2018/2019
නිශ්පාදනය	මෙ.ටො.	8,533	7,661	11,283	22,772	16,563
අලෙවිය	මෙ.ටො	8,866	14,312	23,484	13,063	16,146
ආදායම	රු..	343,140,970	249,051,040	201,568,231	103,473,982	155,380,640
දළ ලාභය	රු.	175,379,118	132,998,887	72,039,111	19,170,216	47,041,469
ශුද්ධ ලාභය	රු.	134,806,255	109,940,047	60,170,921	12,796,333	35,176,712
ශුද්ධ වත්කම්						
ජංගම නොවන මුළු වත්කම්	රු.	141,149,360	132,385,413	276,402,270	149,768,539	198,751,368
මුළු ජංගම වත්කම්	රු.	442,553,826	306,829,638	74,059,721	146,737,592	103,592,678
අඩු කලා ජංගම නොවන වගකීම්	රු.	(26,671,517)	(11,901,537)	(10,003,783)	(9,296,086)	(11,387,535)
අඩුකළා ජංගම වගකීම්	රු.	(63,356,504)	(27,177,932)	(18,712,426)	(12,657,428)	(19,574,079)
		493,675,165	**400,135,582**	**321,745,782**	**274,552,617**	**271,382,432**
කොටස් හිමියන්ගේ අරමුදල්						
නිකුත් කල කොටස් ප්‍රාග්ධනය	රු.	30,000,000	30,000,000	30,000,000	30,000,000	30,000,000
	රු.					
සංචිත		463,675,165	370,135,582	291,745,782	244,552,617	241,382,432
		493,675,165	400,135,582	**321,745,782**	**274,552,617**	**271,382,432**
රජයට ආදායම්						
ආදායම් බදු	රු.	36,358,203	21,051,885	9,997,609	498,090	6,559,465
කොටසක් සඳහා ඉපයීම	රු.	449.35	366.46	**200.56**	**42.65**	**117.25**

7. ප්‍රධාන මාණ්ඩලික නිලධාරීන්ගේ විස්තර

නම	තනතුර	සුදුසුකම්	නැෂනල් සොල්ට් ලිමිටඩ් හි සේවා කාලය
එම්.ජේ. තුවාන් මන්සිල් මහතා	සාමාන්‍යාධිකාරී	BSc. MBA, Dip in HRM, Dip in Eng. AAT-1	2014 සැප්තැම්බර් මස සිට
ආර්.වී. විනෝහරන් මහතා	මූල්‍ය කළමනාකරු	ACMA	2017 ජනවාරි මස සිට
ඒ.කිෂෝතරන් මහතා	කළමනාකරු- ලුණු ලේවාය	B.Sc /PGD	2008 අප්‍රේල් මස සිට
ඩී.ජේ.එච්.එස්. පුෂ්පකුමාර මහතා	සහකාර මූල්‍ය කළමනාකරු	CASL (Inter)	2019 පෙබරවාරි මස සිට
එම්.එෆ්. ෆහිසාල් මහතා	සහකාර කළමනාකරු - ලුණු ලේවාය	Dip in Mec Eng.	2010 නොවැම්බර් මස සිට
එස්.ජේ. ජිනදාස මිය	අභ්‍යන්තර විගණන නිලධාරී	G.C.E. A/L AAT satge 1& 2 & Dip in HR	20 12අප්‍රේල් මස සිට
ඊ. විජයාන් මයා	සහකාර කළමනාකරු- ලුණු ලේවාය	G.C.E. Advance level	2002 අප්‍රේල් මස සිට
එස්. රොබින්සන් මහතා	කළමනාකරු -ලුණු ලේවාය	BSc.	2022 සැප්. මස සිට

8. සංවිධාන ව්‍යුහය


සභාපති
අධ්‍යක්ෂ මණ්ඩලය
සාමාන්‍යාධිකාරී
HM 1-3
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -01
HM 1-1
මූල්‍ය කළමනාකරු -01 MM 1-1
පිරිවැය ගිණුම් කළමනාකරු - 1 MM-1
අලෙවි කළමනාකරු MM 1-1
කළමනාකරු ලුණු ලේවාය 02 MM 1-1
පරිපාලන කළමනාකරු 01 MM 1-1
අභ්‍යන්තර විගණක MM1-1 - 01
ස. මූල්‍ය කළමනාකරු -01 JM1-1
ස. අලෙවි කළමනාකරු 01
ස. ත. පාලන කළමනාකරු ලුණු ලේවාය 01
ස. කළමනාකරු ලුණු ලේවාය -05
ස. පරිපාලන කළමනාකරු - 01 JM1-1
අභ්‍යන්තර විගණන නිලධාරී -01 JM1-1
තාක්ෂණ නිලධාරී 01
ලුණු ලේවා නිලධාරී (07) MA 2-1
ලබඩා භාරකරු (03) MA2-1
කළමනාකරණ සහකාර (07 MA 1-1
කළමනාකරණ සහකාර (04) MA 1-1
ආරක්ෂක ස්ථානභාර නිලධාරී (02) MA 1-2
කළමනාකරණ සහකාර (7) MA 1-1
කළමනාකරණ සහකාර (01) MA 1-1
ප්‍රාථමික මට්ටම පුහුණු (23) රියදුරු 06 කාර්මික ශිල්පී -2 විදුලි කා. ශිල්පී -3 අධීක්ෂක - 8 තාක්ෂණ ශිල්පී 2 ((විද්‍යාගාර සහ වාරිමාර්ග) කාර්මික ශිල්පී - 2 (සිවිල්) PL-3
අධ්‍යක්ෂ (04)
ප්‍රාථමික මට්ටම අඩ පුහුණු (14) ස. කාර්මික ශිල්පී -03 ස. ගබඩා පාලක 03 පොම්ප ක්‍රියාකරු - 08 PL-2
ප්‍රාථමික මට්ටම නුපුහුණු (75) කාර්යාල සහයක - 6 කම්කරු -61 ආරක්ෂක -08 PL-1

9. <u>අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව</u>

සමාගමේ අධ්‍යක්ෂවරු විසින් 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද ශේෂ පත්‍රය සහ ආදායම් ප්‍රකාශණය සමඟ ඔවුන්ගේ වාර්තාව ද මේ සමඟ ඉදිරිපත් කරති.

<u>ප්‍රධාන ක්‍රියාකාරකම්</u>

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ ලුණු නිෂ්පාදනය හා අලෙවියයි.

<u>මූල්‍ය සාරාංශය</u>

2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය

	Rs.
මුළු පිරිවැටුම	343,140,970
දල ලාභය	175,379,118
බදු පෙර ලාභය	192,871,896
කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ ලාභය / (බදු ගෙවීමෙන් පසු)	134,806,255
කොටසක ඉපයීම	**449.35**

<u>අධ්‍යක්ෂවරු.</u>

2022/23 වර්ෂය තුළ සමාගමේ අධ්‍යක්ෂවරුන් ලෙස ක්‍රියා කළ නිලධාරීන් පහත දැක්වේ.

1. ඒ. පී. මොරගොඩ මහතා – සභාපති 09/12/2022 දින දක්වා

   ඩී.ආර්. අනුර බණ්ඩාර මහතා – සභාපති 13/12/2022 දින සිට

2. එල්. පී. වැවලගේ මහතා – භාණ්ඩාගාර නියෝජිත - 09/12/2022 දින සිට

3. ඩබ්. පී හපුආරච්චි මහතා - 09/12/2022 දින දක්වා

4. එල්. කේ. ජේ. ප්‍රියංකර මහතා - 09/12/2022 දින දක්වා

5. ආචාර්ය එස්. එම්. ජේ. ධර්මකීර්ති මහතා - 09/12/2022 දින දක්වා

6. ආචාර්ය එම්. එච්. එන්. කරුණාසිරි මහතා - 09/12/2022 දින දක්වා

7. එම්. එම්. ශාන්ත කුමාර මහතා - 09/12/2022 දින දක්වා

8. ඩබ්. එම්. එන්. ජයන්ත පුෂ්පකුමාර මහතා - 13/12/2022 දින සිට

09. ඩබ්. එම් ජානක ආර්. වික්‍රමසිංහ මහතා - 13/12/2022 දින සිට

10. ආර්. එම්. ශ්‍රීලාල් තිලකරත්න මහතා - 13/12/2022 දින සිට

11. සේපාල සෙනෙවිරත්න මහතා - 13/12/2022 දින සිට

12. එච්. එම්. ධම්මික කේ ප්‍රේමතිලක මහතා - 13/12/2022 දින සිට

<u>අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමි කාරිත්වය</u>

අධ්‍යක්ෂවරුන් සමාගමේ එකම කොටසකටවත් හිමිකම් නොකියයි.

<u>කොන්ත්‍රාත්තුවලින් අධ්‍යක්ෂවරුන්ට ලැබෙන පොලිය</u>

සමාගම සමඟ ඇති කිසිදු කොන්ත්‍රාත්තුවකින් අධ්‍යක්ෂවරුන්ට සෘජු හෝ වක්‍ර පොලියක් නොලැබේ.

<u>විගණකවරු</u>

සමාගමේ වර්තමාන විගණක වරයා වන්නේ ශ්‍රී ලංකාවේ ජාතික විගණන කාර්යාලය යි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි

සමාගමේ ලේකම්

විගණනය කරන ලද ගිණුම්
2022/2023

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } IMT/A/NSL/FA/2022-23/06 මගේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2024 පෙබරවාරි 06 දින

සභාපති,

ජාතික ලුණු සමාගම

සි/ස ජාතික ලුණු සමාගමේ 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත :- ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. IMT/A/NSL/FA/2022-23/06 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2024 පෙබරවාරි 08 දින

සභාපති,

ජාතික ලුණු සමාගම

සී/ස ජාතික ලුණු සමාගමේ 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සී/ස ජාතික ලුණු සමාගමේ 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) දේපල පිරියත හා උපකරණ පිළිබඳව කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයෙහි 17.2 ඡේදය පරිදි, අලිමංකඩ ලුණු ලේවායේ වටිනාකම රු.6,828,395 ක් වූ වාහන සහ උපකරණ, හාන්ඩ සමීක්ෂණ වාර්තාවේ ඇතුළත් කර තිබුණද, එම වත්කම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර නොතිබුණි.

(ආ) දේපල පිරියත සහ උපකරණ පිළිබඳ කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ 17.19 ඡේදය පරිදි වත්කම් ඇස්තමේන්තු කර ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ක්ෂය වී තිබූ වටිනාකම රු.7,856,096ක් වූ උපකරණ සමාලෝචිත වර්ෂය තුල භාවිතා කර තිබුණි.

(ඇ) කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 23.10 ඡේදය පරිදි සමාගම විකුණූ ලුණු තොගය ගැණුම්කරු විසින් ඉවත් කර ගන්නා අවස්ථාවේදී එහි වටිනාකම ආදායමට බැර කළ යුතු වුවත්, විකුණුම් ඉන්වොයිසිය සඳහා ලැබෙන මුදල සම්පූර්ණයෙන් ආදායම ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එම හේතුවෙන් 2021/2022 වර්ෂයේදී ආදායම ලෙස හඳුනාගැනීම හේතුවෙන් 2022/2023 වර්ෂයට අයත් රු.10,164,900 ක් ආදායමට ගෙන නොතිබීම හා 2023/2024 වර්ෂයට අයත් රු.7,500,600 ක අදායමක් 2022/2023 වර්ෂයේ ආදායමට ගෙන තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.2,664,300 කින් අඩු වී තිබුණි.

(ඈ) විගණනයේ ගණනයකිරීම් අනුව අලිමංකඩ හා මන්නාරම ලුණු ලේවායන් දෙකෙහි අවසන් තොග වටිනාකම රු.19,302,311 ක් වුවද, අවසන් ගිණුම්වල අවසන් තොගයේ වටිනාකම රු.16,939,168 ක් ලෙස ගැනීමෙන් තොගයේ වටිනාකම රු.2,363,143 කින් අඩුවෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සමාගමේ 2022/2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2022/2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2022/2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍යම පරිමාණයේ ආස්ථාන්ව සඳහා වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (SMEs සඳහා SLFRS) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ දක්වා ඇති (අ) හා (ආ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛයේ රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.6 ඡේදය	සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් ගිණුම් වර්ෂය අවසන් වී දින හැටක් (60) ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් සමාගම විසින් සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2023 නොවැම්බර් 01 දින එනම් මාස 05 ක ප්‍රමාදයකින් පසු විගණනයට ඉදිරිපත් කරන ලදී. තවද, 2023 ඔක්තොබර් 25 දින තෙක් වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් විගණනයට ඉදිරිපත් නොකරන ලදී.
(ආ)	2021 නොවැම්බර් 16 දිනැති 01/2021 මුදල් අමාත්‍යාංශ වක්‍රලේඛය යටතේ නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොතෙහි 3.2 (v) ඡේදය හා මුදල් ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2022	සමාගම විසින් 2022 ජුනි මස සිට 2022 දෙසැම්බර් දක්වා සියළුම නිළධාරීන් සඳහා රු.5,000 ක මාසික දීමනාවක් ගෙවා තිබූ අතර එම දීමනාව නවතා 2023 ජනවාරි සිට මාස 6 ක කාලසීමාවක් සඳහා තනතුර මත රු.500 – 850 ත් අතර දෛනිකව අර්බුද දීමනාවක් වශයෙන් නිලධාරීන් 111 ක් සඳහා රු.10,032,098 ක් වක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් ගෙවා තිබුණි.

	අගෝස්තු 08 දිනැති පීඊඩී 04/2022 චක්‍රලේඛයේ 2.5 ඡේදය	
(ඇ)	2022 දෙසැම්බර් 21 දිනැති අංක 09/2022 දරන මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ චක්‍රලේඛය	2022 වර්ෂය සඳහා ලාභය මත ප්‍රසාද දීමනා ගෙවීමේ දී පැමිණීම , කාර්යයසාධනය හෝ වෙනත් ආකාරයේ දිරි දීමනාවක් ගෙවන ආයතන සඳහා රු.20,000 ක දීමනාවක් ගෙවිය හැකි වුවද, අලිමංකඩ හා මන්නාරම ලුණු ලේවාවල සෘතුමය නිලධාරීන් 123 ක් සඳහා රු.25,000 බැගින් ප්‍රසාද දීමනාවක් ගෙවීම හේතුවෙන් රු.615,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

මන්නාරම ලුණු ලේවාය සඳහා සිව්වර්ණ (LLDPE) සහිත බෑග් 1,200,000 මිලදී ගැනීමට 2021 ඔක්තෝබර් 15 දින පුවත්පත් දැන්වීමක් පල කර 2021 දෙසැම්බර් මාසයේදී බෑගයක් සඳහා මිල රු. 5.08 කට එකඟ වී ආයතනයක් තෝරාගෙන තිබුණි. එසේ වුවද, ඇනවුම් ඉදිරිපත් කිරීම 2022 පෙබරවාරි මාසය දක්වා ප්‍රමාදවීම හේතුවෙන් රුපියල අවප්‍රමාණය වීම සැලකිල්ලට ගෙන බෑගයක් රු.14 ක මිලකට සැපයීමට තෝරා ගත් සැපයුම්කරු කැමැත්ත පල කර තිබියදී ටෙන්ඩරයක් ඉදිරිපත් නොකල වෙනත් සැපයුම්කරුවෙකු වෙතින් බෑගයක් රු.14 බැගින් බෑග් 500,000 ක් මිලදී ගෙන තිබුණි. ඇණවුම් ලබා දීමේ ප්‍රමාදය හේතුවෙන් සමාගමට වැඩි මිලකට බෑග් මිලදී ගැනීමට සිදු වීම හේතුවෙන් රු. 4,462,000ක අලාභයක් දැරීමටද සිදුවී තිබුණි.

2.3 **වෙනත් කරුණු**

(අ) සමාලෝචිත වර්ෂයේ අයවැය දත්ත පරීක්ෂාවේදී මන්නාරම ලුණු ලේවායෙන් **Comman Salt** මෙට්‍රික් ටොන් 5,500 ක් හා අලිමංකඩ ලුණු ලේවායෙන් මෙට්‍රික් ටොන් 16,000 ක නිෂ්පාදනයක් කිරීමට ඇස්තමේන්තු කර ඇති නමුත් සත්‍ය නිෂ්පාදනය පිලිවෙලින් මෙට්‍රික්

ටොන් 2,215ක් හා මෙට්‍රික් ටොන් 6,167 ක් පමණ විය. එනම් පිලිවෙලින් මෙට්‍රික් ටොන් 3,285 ක් හා මෙට්‍රික් ටොන් 9,833ක ප්‍රමාණයක් සමාගමට නිෂ්පාදනය කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) අලිමංකඩ ලුණු ලේවාය Common Salt Super Grade මෙ.ටොන් 825ක් මෙ.ටොන් 1ක් රු.55,000 ක මිලකට වර්ෂය තුල ගැනුම්කරුවෙකුට අලෙවි කර තිබුණි. සමාගම Common Salt Grade කිරීම ඇස් මට්ටමින් පරීක්ෂා කර බලා තීරණය කරන බැවින් එම නිර්ණායකම විකුණන ලද Super Grade ලුණු සඳහා ද යොදාගෙන තිබුණි. එම හේතුවෙන් Super Grade මෙට්‍රික් ටොන් 825 හි වර්ණයේ විවිධත්වයක් පවතින බවත් (Variation of Color), බාහිර සංඝටක ඇති බවත් (Presence of Extraneous matters), මඩ සහ වැලි අංශු පවතින බවත් (presence of mud and Sand Particles) මිලදී ගත් ආයතනය විසින් සමාගම වෙත දැනුම් දී තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

ජාතික ලුණු සමාගම

2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

මූල්‍ය ප්‍රකාශණ

ජාතික ලුණු සමාගමේ

2023 මාර්තු මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය.

	සටහන්	2023 රු. ශත	2022 රු. ශත
මුළු ආදායම	3	343,140,970	249,051,040
අඩු කිරීම			
අගය එකතු කිරීම මත බදු			
ශුද්ධ ආදායම		343,140,970	249,051,040
විකුණුම් පිරිවැය	4	167,761,852	116,401,374
දල ලාභය		175,379,118	132,649,666
අනෙකුත් මෙහෙයුම් ආදායම්	5	15,579,808	8,514,700
		190,958,926	141,164,366
විකුනුම් සහ බෙදාහැරීමේ පිරිවැය	6	(6,731,065)	(103,832)
පරිපාලන වියදම්	7	(31,952,185)	(15,535,141)
අනෙකුත් මෙහෙයුම් වියදම්	8	(3,228,650)	(1,928,179)
		(41,911,900)	(17,567,152)
මෙහෙයුම් ලාභය/ (පාඩුව)		149,047,026	123,597,214
මූල්‍ය ආදායම්	9	43,960,568	7,681,573
මූල්‍ය පිරිවැය		(135,698)	(286,855)
වර්ෂය සඳහා වන ආදායම් බදු ගෙවීමට පෙර ලාභය		192,871,896	130,991,932
ආදායම් බදු වියදම්	10	58,065,642	21,051,885
වර්ෂය සඳහා වන ආදායම් බදු ගෙවූ පසු ලාභය		134,806,255	108,940,047
වර්ෂය සඳහා ශුද්ධ ලාභය		134,806,255	109,940,047
අනෙකුත් විස්තීර්ණ ආදායම්			
අව ප්‍රමාණය කරන ලද ලාභ / (පාඩු) මත බලපාන විලම්බිත බදු		(720,000)	
මුළ්‍ය විස්තීර්ණ ආදායම්		**134,086,255**	109,940,047
කොටසක් සඳහා මූලික ඉපයීම	11	447	366

(පිටුව 01)

ජාතික ලුණු සමාගම

2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

සටහන්		2023 රු.	2022 රු.
ජංගම නොවන වත්කම්			
දේපළ යන්ත්‍ර සහ උපකරණ ,	12	141,149,360	132,385,413
		141,149,360	132,385,413
ජංගම වත්කම්			
පරිලේඛණ (ඉන්වෙන්ට්‍රි)	13	59,421,160	21,663, 605
මූල්‍යමය වත්කම්	14	272,561,908	217,190, 208
වෙළඳාම් සහ අනෙකුත් ලැබීම්	15	33,225,220	6,300,797
මුදල් සහ මුදලට සමාන දේ	16	77,345,538	61,675,028
		442,553,826	306,829,638
මුළු වත්කම්		583,703,186	439,215,050
කොටස් සහ වගකීම්			
ප්‍රාග්ධනය සහ සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	17	30,000,000	30,000,000
ප්‍රත්‍යාගණිත සංචිත		1,680,000	2,400,000
ආදායම් සංචිත	18	426,713,139	317,628,963
සමස්ථ කොටස්		458,393,139	350,028,963
ජංගම නොවන වගකීම්			
රජයේ ප්‍රතිපාදන	19	35,282,026	50,106,618
විලම්භිත බදු බැරකම් / (වත්කම්)	20	16,124,684	2,258,522
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	21	10,546,833	9,643,015
		61,953,543	62,008,155
ජංගම වගකීම්			
වෙළඳ සහ අනෙකුත් ගෙවීම්	22	26,998,301	16,253,506
ගෙවිය යුතු / (නැවත අයකර ගත හැකි) ආදායම් බදු	23	36,358,203	10, 924,427
		63,356,504	27,177,932
සමස්ථ කොටස් සහ		**583,703,186**	**439,215,050**

මෙම මූල්‍ය ප්‍රකාශණ 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

---------- 2023/10/13

මූල්‍ය කළමනාකරු දිනය

මෙම මූල්‍ය ප්‍රකාශණ පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය වග කියනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්,

නම	අත්සන
අධ්‍යක්ෂ 1	----------
අධ්‍යක්ෂ 2	----------

අනුමත කර අත්සන් කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අත්සන් කරන ලද දිනය 2023/10/13

(පිටුව 02)

ජාතික ලුණු සමාගම

2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සම කොටස් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය.

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ප්‍රත්‍යාගණිත සංචිත	ආදායම් සංචිත	එකතුව
	රු.	රු.	රු.	රු.
2020 මාර්තු 31 වන දිනට ශේෂය	30,000,000	2,400,000	174,269,603	206,669,603
වර්ෂය සඳහා ශුද්ධ ලාභය			60,170,921	60,170,921
ලාභාංශ ගෙවීම			(3,351,608)	(3,351,608)
2021 මාර්තු 31 වන දිට ශේෂය	30,000,000	2,400,000	231,088,916	263,488,916
වර්ෂය සඳහා ශුද්ධ ලාභය			109,940,047	109,940,047
ලාභාංශ ගෙවීම			(23,400,000)	(23,400,000)
2022 මාර්තු 31 වන දිනට ශේෂය	30,000,000	2,400,000	317,628,964	**350,028,964**
කලින් වර්ෂයේ බදු කුලිය ගැලපීම - මන්නාරම			(5,722,080)	(5,722,080)
වර්ෂය සඳහා ශුද්ධ ලාභය			134,806,255	134,806,255
ප්‍රත්‍යාගණිත ඉපයීම් මත බලපාන විලම්බිත බදු		(720,000)		(720,000)
ලාභාංශ ගෙවීම			(20,000,000)	(20,000,000)
2023 මාර්තු 31 වන චිනය ශේෂය	30,000,000	1,680,000	426,713,139	458,393,139

(පිටුව 03)

මාන්තායි සෝල්ට් ලිමිටඩ්

2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය.

	2023		2022
	රු		රු
මෙහෙයුම් කටයුතුවලින් මූල්‍ය ප්‍රවාහය	192,871,896		130,991,933
බදු ගෙවීමට පෙර මෙහෙයුම් ලාභය/(පාඩුව)			
ගැලපීම්			
ක්ෂය සහ ක්‍රමක්ෂය	22,323,450		13,288,480
ක්‍රමක්ෂය	(14,824,592)		(8,150,249)
වත්කම් බැහැර කිරීම මත ලාභය	(230,350)		
පාරිතෝෂික ප්‍රතිපාදන	1,219,457		
ආදායම් බදු ප්‍රතිපාදන			(214,884)
කපා හරින ලද අය විය යුතු වැටි බදු ආදායම්			
ස්ථිර තැන්පතු පොලී ආදායම්	(42,841,697)		(6,612,175)
තැන්පතු පොලී ආදායම්			
තැන්පතු පොලී ආදායම් රඳවා ගැනීමේ බදු	(19,252)		
	(34,372,984)		(1,688,828)
කාරක ප්‍රාග්ධනය වෙනස්වීම්වලට පෙර වර්ෂය සඳහා මෙහෙයුම් ලාභය	158,498,912		129,303,105
කාරක ප්‍රාග්ධනයේ වෙනස් වීම්			
පරිලේඛණයන් (ඉන්වෙන්ට්‍රි) හී වැඩිවීම්/(අඩුවීම්)	(37,757,555)		27,307,046
වෙළඳ සහ අනෙකුත් ලැබීම් හී (වැඩිවීම)/ අඩුවීම්	(231,436)		1,078,380
වෙළඳ සහ අනෙකුත් ගෙවීම් හී (වැඩිවීම)/ අඩුවීම්	10,744,795		1,068,880
	(27,244,196)		29,454,306
මෙහෙයුම් තුලින් ජනනය වූ මුදල්	131,254,716		158,757,410
පාරිතෝෂික ගෙවීම්	(315,638)		(758,120)
ආදායම් බදු/රඳවාගත් බදු ගෙවීම්	(19,330,000)		10,784,502
	(19,645,638)		(11,542,622)
මෙහෙයුම් කටයුතු තුලින් ගලා ආ ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	111,609,078		147,214,788
ආයෝජන කටයුතුවල මූල්‍ය ප්‍රවාහය			
දේපළ, යන්ත්‍ර සහ උපකරණ	(20,724,021)		(2,672,800)
ස්ථිර වත්කම් බැහැර කිරීම්	230,350		(2,964,765)
කාරක වර්ධනය	(10,386,613)		20,000,000
ආයෝජන ඉවත්කර ගැනීම්	214,759,032		(95,000,000)
ස්ථාවර තැන්පතුවල ආයෝජනය	(260,000,000)		1,610,596
ස්ථිර තැන්පතු පොලී ආදායම්	5,881,528		
මන්නාරම කල්බදු කුලී	5,722,080)		
ආයෝජන කටයුතුවලින් ගලා ගිය ශුද්ධ මූල්‍ය ප්‍රවාය	(75,961,804)		(79,026,969)
මූල්‍ය කටයුතුවල මූල්‍ය ප්‍රවාහය			

ලාභාංශ ගෙවීම්	(20,000,000)		(23,400,000)
රජයේ ප්‍රතිපාදන ලැබීම්			
මූල්‍ය කටයුතුවලින් ගලා ආ ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	(20,000,000)		(23,400,000)
වර්ෂය තුළ මුදල් සහ මුදල්වලට සමාන දෑවල ශුද්ධ වර්ධනය			
වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් වලට සමාන දෑ	15,670,510		44,787,819
වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල්වලට සමාන දෑ	61,675,028		16,887,208
	77,345,538		61,675,027
වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල්වලට සමාන දෑ විශ්ලේෂණය කිරීම			
බැංකුවේ ඇති මුදල්	77,345,538		61,675,027

(පිටුව 04)

ජාතික ලුණු සමාගම

2023 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්.

1. සංස්ථාපිත තොරතුරු

1.1 වාර්තාකරණ අස්තීත්වය

ජාතික ලුණු සමාගම යනු ශ්‍රී ලංකාවේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය (පූර්ණ වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට අයත්) යටතේ ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත සීමිත වගකීම් සහිත රාජ්‍ය ව්‍යාපාර සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 05, ඇල්විටිගල මාවතේ 561/3 දරන ස්ථානයේ පිහිටා ඇති අතර, ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ග්‍රෑන්ඩ් බසාර්, මන්නාරම සහ අලි මංකඩ යන ස්ථානයන් හී පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වූයේ ශ්‍රී ලංකාවේ ලුණු නිෂ්පාදනයේ දීර්ඝ ඉතිහාසය ඉදිරියට ගෙන යාමයි. එම සමාගම සාමාණ්‍ය ලුණු නිෂ්පාදනය කරන අතර ඒවා අයඩින් සහිත ලුණු, කැට ලුණු, සහ කාර්මික ලුණු ආකාරයට ශ්‍රී ලංකාව තුළ බෙදා හරිනු ලැබේ.

1.3 අංක 05 සිට 42 දක්වා පිටුවල දක්වා ඇති මූල්‍ය ප්‍රකාශණය සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් ලෙස අකණ්ඩව පවතී.

1.4 වර්ෂය අවසාන වන විට සේවක සංඛ්‍යාව 57 කි (2022-53)

1.5මූල්‍ය ප්‍රකාශණයට බලය දුන් දිය සහ අනුමත කළ දිනය

2023 මාර්තු 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ජාතික ලුණු සමාගමේ මූල්‍ය ප්‍රකාශණ සඳහා වන සටහන් 2023 ඔක්තෝම්බර් 13 වන දිනැති අධ්‍යක්ෂ මංඩලයේ යෝජනා සම්මතය අනුව නිකුත් කිරීමට බලය දෙන ලදී.

2. සකස්කිරීමේ පදනම සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති.

2.1 සමාන්‍ය ප්‍රතිපත්ති

2.1.1 අනුකූලතා ප්‍රකාශය

මෙම මූල්‍ය ප්‍රකාශය, ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කරන ලද කුඩා හා මධ්‍යම පරිමාණ අස්ථිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ නිර්ණායකයන්ට අනුකූලව ඓතිහාසික පිරිවැය පදනම මත පදනම්ව සකස් කර ඇත. **(පිටුව 05)**

2.1.2 සකස්කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශණ ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කරන ලද කුඩා හා මධ්‍යම පරිමාණ අස්ථීත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශණ ශ්‍රී ලංකා රුපියල් (රු.) වලින් ඉදිරිපත් කරන අතර, ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරනු ලබන සියළු මූල්‍ය තොරතුරු ආසන්න රුපියලට වටයා ඇත.
සමාගමේ මූල්‍ය ප්‍රකාශයන් ෙඑතිහාසික පිරිවැය සම්මුතිය මත සකස් කර ඇත.

වර්තමාන නිරූපනය සමඟ සනාත කිරීම සඳහා, අවශ්‍ය ව්‍යවස්ථාවන් හී වර්තමාන වර්ෂය සඳහා වන ඉදිරිපත් කිරීම් සමඟ ගැලපෙන පරිදි සංසන්දනාත්මක තොරතුරු අවශ්‍ය පරදි නැවත වර්ගීකරණ කර නොමති නම් සහ වෙනත් ආකාරයකින් ප්‍රකාශකර නොමැති නම් සමාගම විසින් භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුරූප වේ.

2.1.3 අඛණ්ඩභාවය

අධ්‍යක්ෂවරුන් විසින්, සමාගම අඛණ්ඩව ඉදිරියට පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර, ඔවුන් එය ඈවර කිරීමට හෝ වෙළඳාම නතර කිරීමට අදහස් නොකරයි.

2.1.4 ඇස්තමේන්තු සහ තීන්දු භාවිතා කිරීම

ගිණුම්කරණ ප්‍රතිපත්ති යෙදවුම් සහ වාර්තා කරන ලද වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් ප්‍රමාණයට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් සිදු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද කුඩා හා මධ්‍යම පරිමාණ අස්ථීත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම කළමනාකාරීත්වයට අවශ්‍ය වේ. තථ්‍ය ප්‍රතිඵල ඇස්තමේන්තුගත ප්‍රතිඵලවලින් වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ පාදක වූ උපකල්පන පදනම් වී ඇත්තේ ෙඑතිහාසික අත්දැකීම් සහ ඒ ඒ තත්වයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කෙරෙන අනාගත සිදුවීම් පිළිබඳ අපේක්ෂාවන් ඇතුළු විවිධ සාධක මත ය.

ඇස්තමේන්තු සහ මූලික වූ උපකල්පනයන්, කටයුතු අඛණ්ඩව සිදුකරගෙන යන්නේ යැයි යන පදනම මත සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තු සංශෝධනය කරන ලද කාල පරිච්ඡේදය තුළ සහ බලපෑමට ලක්වන ඔනෑම අනාගත කාල පරිච්ඡේදයන් තුළ ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා වන සංශෝධන හඳුනා ගැනේ.

2.1.5 වැදගත්කම් සහ සමූහණය

සමාන අයිතමවලින් යුතු සෑම ප්‍රමාණාත්මක පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ. ස්වභාවයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් අසමාන අයිතම ඒවා වැදගත් වන්නේ නම් මිස වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

2.1.6 වාර්තාකරන කාල පරිච්ඡේදයෙන් පසුව සිදුවී ඇති වැදගත් සිදුවීම්.

වර්තාගත කරන ලද දිනට පසුව සිදු වී ඇති සිදුවීම් වල වැදගත්කම සළකා බලා ඇති අතර, අවශ්‍ය අවස්ථාවල දී මූල්‍ය ප්‍රකාශනවල සුදුසු ගැලපීම් සහ අනාවරණය කිරීම් සිදු කර ඇත.

(පිටුව 06)

2.1.7 බදුකරණය

2.1.7. (අ) ප්‍රවර්තන බදු

බදු අය කිරීම සඳහා වන ගාස්තුව පදනම් වන්නේ, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූලව බදු අය නොකරණ භාණ්ඩ සඳහා ගැලපීම් කරන ලද වාර්ෂික ආදායම මත ය.

2.1.7. (ආ) විලම්බිත බදුකරණය

මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා භාවිතා කරණ ලද වත්කම් හා වගකීම් ප්‍රමාණයන් සහ බදුකරණ අරමුණු සඳහා භාවිතා කරන ලද ප්‍රමාණයන් අතර තාවකාලික වෙනස්කම් සම්බන්ධයෙන් විලම්බිත බදු හඳුනාගනු ලැබේ. විලම්බිත බදු ගණනය, වාර්තා කිරීමේ කාලපරිච්ඡේදය අවසානයේදී සමාගම අපේක්ෂා කරන ආකාරයට සමාගමේ වත්කම් සහ වගකීම ප්‍රමාණයන් පියවා ගැනීමට හෝ අයකරගැනීමට අනුගමනය කළ හැකි බදු ප්‍රතිඵලය පිළිබිඹු කරයි.

ප්‍රවර්තන බදු වත්කම් සහ වගකීම් හිලව් කිරීමට නීත්‍යානුකූලව බලාත්මක අයිතියක් තිබේ නම් විල්ම්බිත වත්කම් සහ බැරකම් හිලව් කෙරෙන අතර, එකම බදු අධිකාරිය විසින් බදු අයකළ හැකි එකම බදු ඒකකය මත බදු ගෙවීමට අදාල කිරීම හෝ විවිධ බදු ආයතන ශුද්ධ පදනමක් මත ප්‍රවර්තන බදු වගකීම් හා වත්කම් නිරවුල් කිරීමට ඔවුන් අදහස් කරයි නම් ඔවුන්ගේ බදු වත්කම් සහ වගකීම් එකවර අවබෝධ කරනු ලැබේ.

විලම්බිත බදු වත්ක්මක් ලෙස හඳුනාගනු ලබන්නේ, අනාගත තාවකාලික වෙනස්කම් සඳහා භාවිත කළ හැකි, භාවිතා නොකරන ලද බදු හානි සහ මට්ටමක් දක්වා අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා භාවිත කළ හැකි අනාගතයේ බදු අයකළ හැකි ලාභයයි. වාර්තාකරණ සෑම දිනයකදීම විලම්බිත බදු වත්කම් සමාලෝචනය කරනු ලබන අතර අදාළ ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනීම තවදුරටත් සිදුවිය නොහැකි තරමට අඩු කරනු ලැබේ.

විලම්බිත බදු වත්කම් සහ වගකීම් මනිනු ලබන්නේ වාර්තාකරණ දිනය මගින් බලාත්මක කරන ලද හෝ සැලකිය යුතු ලෙස නීතිගත කර ඇති නීති මත පදනම්ව, ආපසු හැරවීමේදී තාවකාලික වෙනස්කම් වලට අදාළ වනු ඇතැයි අපේක්ෂා කරන බදු අනුපාතයන් මත ය.

ඉදිරියට....

2.1.8 ණය ගැණුම් පිරිවැය

ණය ලබා ගැනීමේ පිරිවැය, කාල සීමාව තුළ දී ඔවුන් විසින් දරන ලද වියදමක් ලෙස හඳුනා ගැනේ.

2.2 වත්කම් තක්සේරු කිරීම සහ ඒවා ගණනය කිරීමේ පදනම.

මූල්‍ය තත්ව ප්‍රකාශණයේ ජංගම වත්කම් ලෙස වර්ග කර ඇති වත්කම් වන්නේ සමාගමේ සාමාන්‍ය ව්‍යාපාර මෙහෙයුම් චක්‍රය තුළ හෝ වාර්තා කරනු ලබන දිනයේ සිට වසරක කාලයක් තුළ අති මුදල් සහ මුදල් බවට පරිවර්තනය කිරීමට බලාපොරොත්තු වන වත්කම් වේ.

ජංගම නොවන වත්කම් යනු වාර්තා කරනු ලබන දිනයේ සිට වසරක කාලයක් ඔබ්බට සමාගම විසින් රඳවා තබා ගැනීමට අපේක්ෂිත වත්කම් වේ.

2.2.1 මුදල් හා මුදලට සමාන දේ

මුදල් හා මුදලට සමාන දේ යන්න, අතේ ඇති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ කෙටිකාලීන ඉහළ ද්‍රවශීලතාවයක් ඇති මුදල් වලට පහසුවෙන් පරිවර්තනය කළ හැකි සහ වටිනාකමෙහි වෙනස් වීමේ සුළු අවදානමට යටත් ආයෝජන ලෙස විස්තර කෙරේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණු සඳහා, මුදල් සහ මුදල් හා සමාන දේවල් යන්න, අතේ ඇති මුදල් සහ බැංකු තැන්පතු ඉල්ලුමට අනුව ආපසු ගෙවිය යුතු බැංකු අයිරා වලින් සමන්විත වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය "චක්‍ර ක්‍රමය" භාවිතා කරමින් පිළියෙළ කර ඇත. මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ අරමුණු සඳහා, ගෙවූ පොලී, ලද පොලී සහ ලැබුණු ලාභාංශ මෙහෙයුම් මුදල් ප්‍රවාහය ලෙස වර්ග කර ඇති අතර, ගෙවන ලද ලාභාංශ මූල්‍ය මුදල් ප්‍රවාහය ලෙස වර්ග කර ඇත.

2.2.2 දේපළ , යන්ත්‍ර සහ උපකරණ

දෙපළ, යන්ත්‍ර සහ උපකරණ අයිතමයන් මනිනු ලබන්නේ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානි පාඩු අඩු කිරීමෙනි.

පිරිවැය යන්නට, වත්කම් අත්පත් කර ගැනීම සඳහා සෘජුවම ආරෝපණය කළහැකි වියදම් ඇතුළත් වේ. ස්වයංව සාදන ලද වත්කම්වල (self-constructed) පිරිවැයට පහත සඳහන් දේ ඇතුළත් වේ: **(පිටුව 8)**

දේපළ, යන්ත්‍ර සහ උපකරණ (ඉතිරිය.)

- අමුද්‍රව්‍ය පිරිවැය සහ සෘජු ශ්‍රම පිරිවැය
- වත්කමක්, ඒවායේ අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්වයට ගෙන ඒම සඳහා සෘජුව දරන ලද වෙනත් ඔනෑමවියදමක් ;
- වත්කම් ඉවත් කිරීමට හෝ නැවත වැඩ බිමේ ස්ථාපිත කිරීමට සමාගම බැඳී ඇති විට, භාණ්ඩවල කොටස් ඉවත් කිරීම, එවා පිහිටි ස්ථානයෙන් ඉවත් කිරීම සහ නැවත ස්ථාපිත කිරීම සඳහා ඇස්තමේන්තු කළ පිරිවැය;

අදාළ උපකරණවල ක්‍රියාකාරීත්වයට අත්‍යවශ්‍ය වන මිලදී ගත් මෘදුකාංග එම උපකරණයේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කර ඇත. දේපල, යන්ත්‍ර සහ උපකරණ අයිතමයේ කොටසක විවිධ ප්‍රයෝජනවත් භාවිතාවන් ඇති විට, ඒවා දේපල, යන්ත්‍ර සහ උපකරණවල වෙනම අයිතම (ප්‍රධාන සංරචකයේ) ලෙස ගණන් ගැනේ.

බැහැර කිරීම් මත කිසියම් ලාභයක් හෝ අලාභයක් (අයිතමයේ අපහරණයෙන් ශුද්ධ නිකුතුව සහ අයිතමයේ ප්‍රවාහන පිරිවැය අතර වෙනස ලෙස ගණනය කරනු ලැබේ) ආදායම් ප්‍රකාශයේ වෙනත් මෙහෙයුම් ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ. නැවත තක්සේරු කරන ලද වත්කම් විකුණන විට, නැවත ඇගයීමේ අතිරික්ත සංචිතවලට ඇතුළත් ඕනෑම මුදලක් රඳවාගත් ඉපැයීම් වෙත මාරු කරනු ලැබේ.

පසු පිරිවැය

යම් දේපලකට හෝ උපකරණවලට අයත් අයිතමයේ සංඝටකයක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය, එම කොටස තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා ඒමට ඉඩ තිබේ නම් සහ එහි පිරිවැය විශ්වසනීයව මැනිය හැකි නම් එකී අයිතමයේ ප්‍රවාහන පිරිවැය ලෙස හඳුනා ගනු ලැබේ. ප්‍රතිස්ථාපනය කරන ලද කොටසෙහි ප්‍රවාහන පිරිවැය හඳුනාගෙන නොමැති. දේපල හා උපකරණවල එදිනෙදා සේවා සඳහා වන පිරිවැය, ආදායම් ප්‍රකාශයේ දී දරන ලද වියදමක් ලෙස හඳුනාගෙන ඇත.

අලුත්වැඩියාව සහ නඩත්තුව

අළුත්වැඩියා කිරීම් සහ නඩත්තු කිරීම්, සිදු කරනු ලබන මූල්‍ය කාල පරිච්ඡේදය තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දක්වනු ලැබේ. පවත්නා වත්කම්වල කාර්යක්ෂමතාව පිළිබඳව මෑතකදී කළ තක්සේරු ප්‍රමිතියට අතිරික්තව අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගාමට ගලා ආ විට සහ වත්කමමේ හඳුනාගත හැකි කොටසක් අළුත්වැඩියා කරන විට ප්‍රධාන අළුත්වැඩියා කිරීම් වල පිරිවැය ධාරණ පිරිවැයට ඇතුළත් කරයි. අදාල වත්කම්වල ඉතිරි ඵලදායී ආයු කාලය තුළ ප්‍රධාන නවීකරණයන් ක්ෂය කෙරේ.

(පිටුව 09)

ජාතික ලුණු සමාගම
2023 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය
සඳහා වන මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්.

ක්ෂය

වත්කම් හා අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ, අපේක්ෂිත පරිභෝජන රටාව මඟින් වඩාත් සමීපව විදහා දක්වන බැවින් දේපල හා උපකරණ අයිතමයක එක් එක් කොටසෙහි ඇස්තමේන්තුගත ප්‍රයෝජයට ගන්නා කාලය මත (සක්‍රීය ආයු කාලය) සෘජු රේඛීය පදනමක් මත විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ ක්ෂයවීම් හඳුනා ගනු ලැබේ. ඉඩම් ක්ෂය නොවේ. වර්තමාන හා සංසන්දනාත්මක කාල පරිච්ඡේදයන් සඳහා ඇස්තමේන්තුගත සක්‍රිය ආයු කාලය පහත පරිදි වේ.

වත්කම් පංතිය	පදනම
සියළුම ගොඩනැගිලි	වසර 20 ට වැඩි 5% බැඟින්
යන්ත්‍රෝපකරණ වතුර පොම්ප	වසර 05 ට වැඩි 20% බැඟින්
කාර්යාල උපකරණ	වසර 05 ට වැඩි 20% බැඟින්
සියළුම ගෘහ භාණ්ඩ	වසර 10 ට වැඩි 10% බැඟින්
සියළුම මෝටර් රථ	වසර 10 ට වැඩි 10% බැඟින්
පර්ගණක උපාංග	වසර 05 ට වැඩි 20% බැඟින්
ට්‍රැක්ටර්	වසර 05 ට වැඩි 20% බැඟින්

ක්ෂය කිරීමේ ක්‍රමය, සක්‍රිය ආයු කාලය සහ අවශේෂ වටිනාකම්, එක් එක් වාර්තා කිරීමේ දිනයන් හිදී නැවත තක්සේරු කර සහ උචිත පරිදි සකස් කර ඇත.

ක්‍රියාත්මක කරමින් පවතින ප්‍රාග්ධන වැඩ සටහන්

ක්‍රියාත්මක කරමින් පවතින ප්‍රාග්ධන වැඩසටහන් වල ප්‍රගතිය පිරිවැය අනුව ප්‍රකාශ කෙරේ. මේවා දේපළ, යන්ත්‍ර සහ උපකරණ මෙන්ම ප්‍රාග්ධනායනය සඳහා ඇති පද්ධති සංවර්ධනය කිරීම සඳහා සෘජුව දරන ලද ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් වේ. අපගේ සංවිධානය තුළ ක්‍රියාත්මක කරමින් පවතින ප්‍රාග්ධන වැඩසටහන් 2023 මාර්තු මස 31 වන දිනට ප්‍රාග්ධනීකරණය කර ඇත. එබැවින් 2022/2023 වර්ෂය තුළ අදාළ දේපල ක්ෂයවීම් සිදු කර නොමැත.

2.2.3 කල්බදු

මූල්‍ය කල්බදු

කල්බදු අයිතමයේ හිමිකාරිත්වයට අමතරව සමස්ථ අවදානම සහ ප්‍රතිලාභ ඵලදායී ලෙස සමාගමට මාරු කරන මූල්‍ය කල්බදු මත වන දේපළ, යන්ත්‍ර සහ උපකරණ, ඒවායේ මිළ සහ දේපළ, යන්ත්‍ර සහ උපකරණ ලෙස ප්‍රකටව ඇති ද්‍රව්‍යයන්ට අනුව සහ මෙම වත්කම් භාවිතයෙන් සමාගම ලබා ගැනීමට අපේක්ෂිත ප්‍රයෝජන ලබා ගන්නා කාල පරිච්ඡේදය තුල ක්ෂය අනුව ප්‍රාග්ධනායනය කර ඇත.

බදු හිමිකරුට ගෙවිය යුතු අනුරූපී මුලික මුදල වගකීමක් ලෙස දක්වන අතර, වගකීම්වල ඉතිරි ශේෂය නිශ්චිත පොලී අනුපාතයක් ලෙස ලබා ගැනීම සඳහා කල්බදු ගෙවීම් මූල්‍ය ගාස්තු හා කල්බදු වගකීම් අඩු කිරීම අතර බෙදනු ලැබේ. කල්බදු කාලසීමාව තුළ ගෙවිය යුතු පොලිය අවිනිශ්චිත ගිණුමේ පොලියට මාරු කරනු ලැබේ. එක් එක් මූල්‍ය වර්ෂය සඳහා අදාල වන කුලී බැරකම් හී පොලිය බදු කාලයට අදාලවන ආදායම් ප්‍රකාශයට ඇතුලත් වේ.

(පිටුව 10)

2.2.4 ආයෝජන සහ අනෙකුත් මූල්‍ය වත්කම්

වර්ගීකරණය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි (ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් 9) විෂය පථය තුළ ඇති මූල්‍ය වත්කම්, පහත දැක්වෙන මිණුම් දඩුවලට අනුව වර්ග කරනු ලැබේ.

කාණ්ඩ:

සාධාරණ අගය මත පසුව මැනිය යුතු ඒවා (වෙනත් විස්තීරණ ආදායමක් මඟින් හෝ ලාභ හෝ අලාභ මඟින්}, සහ ක්‍රමක්ෂය මිලකට මැනිය යුතු ඒවා ලෙස වර්ග කෙරේ.

